# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,130 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1244 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1244 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1247 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජූලි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## තනතුරු - ඇබෑර්තු

### සංශෝධනයයි

### අක්මීමන ප්‍රාදේශීය සභාව

2019.04.18 වැනි දින පළ කරන ලද අංක 2119 දරන ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ තනතුරු ඇබෑර්තු යටතේ 04-806 නිවේදනයේ 03 හා 07 කොටස් පහත පරිදි සංශෝධනය විය යුතුය.

03. පොදු සුදුසුකම් :-

රියදුරු තනතුරු සඳහා අයදුම්කරනු ලබන අයදුම්කරුවන්, ද. ප. රා. සේ. කණිෂ්ඨ සේවක ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියට අනුව ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05ක, අනුගාමී වසර 03 ක පදිංචිය සනාථ කළ යුතුය.

07. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඃ

ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය හා ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර හා ප්‍රමාණයන් දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය, ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියන්හි ඇමුණුම 01 හි සඳහන් පරිදි වේ. ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය සඳහා ලකුණු ලබාදීම ගැසට් නිවේදනයේ 07:01 යටතේ දක්වා ඇති ආකාරයට වේ.

මෙම ගැසට් නිවේදනය 2019.05.06 දක්වා ලැබී ඇති අයදුම්පත් වලට අමතරව මෙම ගැසට් නිවේදනය පළ වන දින සිට 2019.07.01 දින දක්වා ලැබෙන අයදුම්පත් භාර ගන්නා බව දන්වමි.

සමරසේන කළුහෙවත්ත,
සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

06-949

---

## පළාත් පාලන නිවේදන

### අයගම ප්‍රාදේශීය සභාව

### පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අයගම ප්‍රාදේශීය සභාව විසින් 2017.01.30 වැනි දින තීරණ අංක 194 පරිදි ගෙන ඇති තීරණය තවදුරටත් බලාත්මක කරමින් 2019.05.21 වැනි දින තීරණ අංක 06:01 යටතේ අයගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලොකු රණසිංහ ආරච්චිගේ නිශාන්ත පුෂ්පකුමාර වන මා විසින් එකී සම්මත අතුරු ව්‍යවස්ථා අයගම ප්‍රාදේශීය සභාව ද වැළඳගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. ආර්. ඒ. නිශාන්ත පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අයගම.

2019 ක් වූ මැයි මස 21 වන දින,
අයගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබූ හා 1988.08.23 දිනැති සහ අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) වැනි කොටස - පළාත් පාලනය අතුරු ව්‍යවස්ථා කොටසේ නිවේදනය කර සබරගමුව පළාත් සභාව විසින් 1990.08.16 දින කියවා සම්මත කර 1990.12.27 දින අංක 642/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ iv(අ) වැනි කොටස - පළාත් සභා, පළාත් සභා නිවේදන කොටසේ පළකරන ලද්ද වූ සම්මත අතුරු ව්‍යවස්ථා අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2017.01.30 දින තීරණ අංක 194 යටතේ තීරණය කර අංක 2022 හා 2017.06.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ vi (ආ) වැනි කොටස - පළාත් පාලනය කොටසේ ප්‍රසිද්ධ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා අයගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන අතීත ක්‍රියාකාරකම්වලටද අගතියක් නොවන පරිදි මින් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට 2019.05.21 දිනැති මහ සභාවේ තීරණ අංක 06.01 යටතේ ඒකමතික සහා සම්මුතියෙන් තීරණය කරන ලදී.

06-719

---

## නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව

### 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 අප්‍රේල් මස 11 වැනි දින පැවති නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මහා සභාවේ දී පහත සඳහන් පරිද්දෙන් තීරණ අංක 04 යටතේ තීරණය කර ඇති බව මෙයින් දනුම් දෙමි.

කේ. කේ. රවී,
සභාපති,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව,
පුලියාවත්ත.

2019 ජුනි මස 12 වැනි දින,
පුලියාවත්ත,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) වන ඡේදය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවග න්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පිළියෙල කරනු ලැබ 2016.02.23 දිනැති අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇත්තා වූත් මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.05.05 දිනැති අංක 2017/42 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV(අ) වැනි කොටසේ පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා අතුරින් පහත සඳහන් අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රය පළ කරන දිනයේ සිට පිළිගනිමින් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන බව ඉහත කී 1952 අංක 06 දරන (261 අධිකාරය) සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇත.

1. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව (නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයෙන් පිටත)
2. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. බදු අය කර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව
6. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

8. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
9. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
10. පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
11. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. සත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
13. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
15. ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
16. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
17. ත්‍රි රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
18. සංචාරක කර්මාන්තය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
19. කුළී රථ වාහන නවාත තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

06-935

---

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

### 2019.07.01 සිට 2019.12.31 දක්වා කාලය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැරලීමේ ගාස්තු පැනවීම

නාත්තන්ඩිය ප්‍රදේශීය සභාව විසින් 2019 වර්ෂයේ මැයි මස 23 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ යෝජනා අංක 05-V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රොෂාන් නිලන්ත ප්‍රනාන්දු,
සභාපති,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව,

2019 මැයි මස 31 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 93 වන වගන්තිය හා 126 වන වගන්තිය යටතේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලදුව 2015.09.25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/40 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2016.09.02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1983 දරන ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසේ ප්‍රකාශිතව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ , වරිපනම් අය නොකරන ප්‍රදේශයක කසල එකතු කිරීමේ කාර්යය සඳහා පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ගාස්තුවක් 2019.07.01 දින සිට 2019.12.31 දක්වා මාසිකව නියම වියයුතු බවට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| 1. වර්ගඅඩි 2,000 හෝ 2000ට අඩු යම් ව්‍යාපාරික ස්ථානයක් සඳහා මාසික ගාස්තුව | 100.00 |
| 2. වර්ග අඩි 2,000ට වැඩි යම් ව්‍යාපාරික ස්ථානයක් සඳහා මාසික ගාස්තුව | 200.00 |
| 3 වර්ග අඩි 2000 හෝ 2000 ට අඩු නිවසක් සඳහා මාසික ගාස්තුව | 50.00 |
| 4. වර්ග අඩි 2000ට වැඩි නිවසක් සඳහා මාසික ගාස්තුව | 100.00 |

06-956

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

## අකුරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙනත් ආදායම් අයකිරීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2018.11.13 දින මහා සභා තීරණ අංක 5.1.12 හා 2019.03.12 දින මහා සභාවේ අංක 5.1.18, 2019.04.05 දින මහා සභාවේ අංක 5.1.2 යටතේ පහත දැක්වෙන යෝජනා තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2019 මැයි මස 28 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේදී වෙනත් ආදායම් අය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් 2018.10.11 දින අංක 5.1.12 යටතේ මහා සභාව ගත් තීරණය අනුව 2018.11.30 දිනැති අංක 2,100 දරන *ගැසට්* නිවේදනයේ 2019 වර්ෂය සඳහා වෙනත් ආදායම් අය කිරීම යටතේ පළ කළ අනු අංක 7 හි අංක 3 ද, අනු අංක 18 හි අංක 2 ද පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

අනු අංක 07 - අකුරණ සති පොළෙහි ගාස්තු අය කිරීම
3. හිස් බිම් වර්ග අඩි 36 ක් සඳහා — රු. 250.00

අනු. අංක 18- ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු (වර්ග අඩියට)
2. පස්පාර කැඩීම සඳහා සම්පූර්ණ මුදල — රු. 500.00

06-936

---

## යාපනය මහ නගර සභාව

යාපනය මහනගර සභාවේ ජල ගාස්තු අය කිරීම් විස්තරය - 2019
මෙම දැනුම් දීමේ බලපැම 01.06.2019

2019.05.07 දිනැති මුදල් කමිටු රැස්වීමට අනුව :

| *විස්තරය* | *ඒකක (ලීටර් 1,000)* | *ගාස්තුව (රුපියල්) බදු රහිතව* | *ස්ථිර සේවා ගාස්තු (රුපියල්)* |
|---|---|---|---|
| ගෘහස්ත පාවිච්චිය සහ ආගමික ස්ථාන | 01 | 232.00 | 100.00 |
| | 02 | 282.00 | |
| | 03 | 332.00 | |
| | 04 | 382.00 | |
| | 05 | 432.00 | |
| | 06-10 | 64.80 (ඒකක ගාස්තුව) | |
| | 11-20 | 86.40 | |
| | 21-30 | 108.00 | |
| | 30ට වැඩි නම් | 129.60 | |

| *විස්තරය* | *ඒකක (ලීටර් 1,000)* | *ගාස්තුව (රුපියල්) බදු රහිතව* | *ස්ථිර සේවා ගාස්තු (රුපියල්)* |
|---|---|---|---|
| | 01 | 448.00 | |
| | 02 | 498.00 | |
| | 03 | 548.00 | |
| | 04 | 598.00 | |
| ශික්ෂණ රෝහල | 05 | 648.00 | 100.00 |
| | 06 - 10 | 64.80 (ඒකක ගාස්තුව) | |
| | 11-20 | 86.40 | |
| | 21-30 | 108.00 | |
| | 30ට වැඩි නම් | 129.60 | |
| | 01 | 328.00 | |
| | 02 | 408.00 | |
| | 03 | 488.00 | |
| | 04 | 568.00 | |
| රජයේ ආයතන | 05 | 648.00 | 100.00 |
| | 06-10 | 108.00 (ඒකක ගාස්තුව) | |
| | 11 -20 | 129.60 | |
| | 21-30 | 151.20 | |
| | 30 ට වැඩිනම් | 172.80 | |
| | 01 | 464.00 | |
| | 02 | 564.00 | |
| නවාතැන් නිවාස | 03 | 664.00 | |
| සංචාරක හෝටල්, තේ කඩයක් | 04 | 764.00 | |
| ආපනශාලා, වෘත්තීමය | 05 | 864.00 | 100.00 |
| ආයතන සඳහා | 06 - 10 | 151.20 (ඒකක ගාස්තුව) | |
| | 11 - 20 | 172.80 | |
| | 21 - 30 | 194.40 | |
| | 30ට වැඩි නම් | 216.00 | |
| *බවුසරයෙන් ජල සැපයුම් :* | | | |
| ටැංකියකින් ජල සැපයීම | ලීටර් 1,000 ක් | 1,739.00 | 100.00 |
| ටැංකිය නොමැතිව ජල සැපයීම | ලීටර් 1,000 ක් | 750.00 | |
| ජල විදිනය | ලීර් 1,000 ක් | 750.00 | |

ආර්. ටී. ජයසීලන්,
නාගරික කොමසාරිස්,
යාපනය මහ නගර සභාව.

06-937

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.